ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය
டிஜிட்டல் பொருளாதார அமைச்சு
Ministry of Digital Economy

1101, 11 වන මහල, වන් ගෝල් ෆේස්, # 1ඒ, මැද පාර, කොළඹ 02
1101, 11 வது மாடி, வந் கோல் பேஸ், # 1A, சென்டர் வீதி, கொழும்பு 02
Unit 1101, 11th Floor, One Galle Face Tower, # 1A, Centre Road, Colombo 02

/modesrilanka
mode.gov.lk

මගේ අංකය / எனது இல / My No.

ඔබේ අංකය / உமது இல / Your No.

දිනය / திகதி / Date 2026/03/18

මාධ්‍ය නිවේදනය.

ඉන්ධන බලපත්‍රය (Fuel Pass) සඳහා වාහන ලියාපදිංචි කිරීමේ සහාය දැන් WhatsApp ඔස්සේ.

රජයේ තොරතුරු කේන්ද්‍රය (GIC) මගින් ජාතික ඉන්ධන බලපත්‍රය (National Fuel Pass) සඳහා ලියාපදිංචි වීමට සහාය අවශ්‍ය රථවාහන හිමියන් වෙනුවෙන් විශේෂ WhatsApp සේවාවක් හඳුන්වා දී ඇත. ඒ අනුව, ලියාපදිංචි වීමේදී ගැටලු පවතින පුද්ගලයන්ට පහත සඳහන් ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් සිය සහාය ලබාගත හැක.

076 000 1919 යන WhatsApp අංකය වෙත ඔබගේ වාහන අංකය (Vehicle Number) ටයිප් කර යොමුකරන්න. (වාහන අංකය ඡායාරූපයක් ලෙස නොඑවිය යුතු බව සලකන්න).

පහත සඳහන් ලේඛනවල පැහැදිලි ඡායාරූප ද ඒ සමඟින් එම අංකයටම යොමු කරන්න:

- ජාතික හැඳුනුම්පත (NIC) / රියදුරු බලපත්‍රය හෝ විදේශ ගමන් බලපත්‍රය.
- වලංගු ආදායම් බලපත්‍රය (Vehicle License).
- වාහන ලියාපදිංචි සහතිකය (CR).

ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබනුයේ වාහනයේ ලියාපදිංචි හිමිකරු පමණි. එහිදී ඉදිරිපත් කරන හැඳුනුම්පත් අංකය, වාහන ලියාපදිංචි සහතිකයේ (CR) සඳහන් හිමිකරුගේ අංකය සමඟ අනිවාර්යයෙන්ම සැසඳිය යුතුය. ඔබ විසින් ලබාදෙන සියලුම පෞද්ගලික දත්ත 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතට අනුකූලව ආරක්ෂා කරනු ලැබේ.

දුරකථන / தொலைபேசி / Telephones +94112334562
ෆැක්ස් / பெக்ஸ் / Fax +94112334576
ඉ-තැපෑල / மின் அஞ்சல் / E-mail info@mode.gov.lk

මෙම දත්ත රැස් කරනුයේ තොරතුරු සත්‍යාපනය කිරීමේ (Validation) අරමුණින් පමණක් වන අතර, සත්‍යාපනය අවසන් වූ පසු වාහන අංකය හැර අනෙකුත් සියලුම පෞද්ගලික දත්ත පද්ධතියෙන් ආරක්ෂිතව ඉවත් කරනු ලැබේ.



Nipuni Rajapaksha
B.A (UOC). MSSC (UOK).
Media Secretary to the Deputy Minister
Ministry of Digital Economy

නිපුනි රාජපක්ෂ
ගරු, ඩිජිටල් ආර්ථික නියෝජ්‍ය අමාත්‍යතුමන්ගේ
මාධ්‍ය ලේකම්